ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ ජනරාල් — තනතුරු සංඛ්‍යාව : 01

සේවා ගණය : **HM 1-3**

## තනතුරෙහි ස්වභාවය

අධ්‍යක්ෂ ජනරාල් ආයතනයෙහි ඉහළම මට්ටමේ විධායක නිලධාරියා වන්නේ ය.ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලබන බලතල, කාර්යයන් හා වගකීම් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ මගපෙන්වීම හා පරිපාලනය යටතේ ඉටුකරමින් ආයතනික කාර්ය මණ්ඩලයට නායකත්වය දෙමින් ද කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ද ආයතනය ඉහලම එලදායීතාව කෙරෙහි යොමුකරවීම ද ආයතනයෙහි සමස්ථ කාර්ය සාධනය සම්බන්ධයෙන් මූලික වගකීම හා වගවීම දැරීම ද ප්‍රධාන විධායක නිලධාරි එනම් අධ්‍යක්ෂ ජනරාල් තනතුර දරණ අයට පැවරෙන කාර්යභාරය වේ.

## සුදුසුකම්

රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර කළමනාකරණය/සාමය සහ ගැටුම් නිරාකරණය/ආර්ථික විද්‍යාව/ නීතිය/ජාත්‍යන්තර සබඳතා, හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

**සමඟ**

රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය/ සාමය සහ ගැටුම් නිරාකරණය/, ආර්ථික විද්‍යාව,/ නීතිය/ජාත්‍යන්තර සබඳතා හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම

**සහ**

උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික හෝ ජාත්‍යන්තර ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## වයස් සීමාව

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**HM 1-3 –** රු. **(152,500 - 15 x 4,100 - 214,000)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED